**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව -2016 වර්ෂය**

----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 12 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

----------

**2.1 විසර්ජන ගිණුම**

--------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,178.80 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,164.30 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14.50 ක් හෙවත් සියයට 1.23 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,011.80 | 997.43 | 14.37 | 1.42 |
| මූලධන | 167.00 | 166.87 | 0.13 | 0.08 |
| | **1,178.80** | **1,164.30** | **14.50** | **1.23** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 16 ක් විසින් එකතුව රු.මිලියන 4,831.77 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 4,391.45 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදන වලින් රු. මිලියන 440.31ක් හෙවත් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 75.00 | 74.99 | 60.00 | 68.39 | 300.00 | 238.01 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. මිලියන 735.21 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0001/0061/000 | 0.48 |
| 6000/0000/00/0002/0079/000 | 0.87 |
| 6000/0000/00/0013/0049/000 | 58.20 |
| 6000/0000/00/0016/0031/000 | 240.00 |
| 6000/0000/00/0017/0010/000 | 433.15 |
| 6000/0000/00/0018/0039/000 | 2.51 |
| එකතුව | **735.21** |

2.4 **විගණන නිරීක්ෂණ**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------------

3.1 **විසර්ජන ගිණුම**

--------------------

3.1.1 **වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන**

---------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) **විශ්‍රාම වැටුප් අංශය**

-----------------------

(i) 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක විශ්‍රාම වැටුප් ගොනු 1708 ක වැටුප් සංශෝධනයන් කර නොතිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක් විසින් පුද්ගලයින් 978 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් ගොනු නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි.

(iii) විශ්‍රාමිකයෙකු හෝ වැන්දඹුවක හෝ වෙනත් අයුරකින් විශ්‍රාම ප්‍රතිලාභයක් ලබමින් සිටින අයකු මියගිය විට ඒ පුද්ගලයන් පිළිබඳ තොරතුරු හැකි ඉක්මනින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සැපයිය යුතුය. එසේ වුවද විශ්‍රාමිකයන් 26 දෙනෙකු සම්බන්ධයෙන් එම තොරතුරු මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදීම මාස 1 සිට මාස 27 දක්වා කාල පරාසයක ප්‍රමාදයක්ද මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 18 දෙනෙකු සම්බන්ධයෙන් දින 27 සිට වර්ෂ 1 දක්වා ප්‍රමාදයක්ද සිදුවී තිබුණි.

(iv) වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් මියයාම් පිළිබඳ නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් අවස්ථා 09 කට අදාළව රු.1,550,665 ක මුදලක් විශ්‍රාමිකයන්ගේ බැංකු ගිණුම් වෙත ඔවුන්ගේ මරණයෙන් පසුවද බැර කර තිබුණි.

(v) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමික පුද්ගලයෙකු 2015 නොවැම්බර් 15 දින මියගොස් තිබුණි. ඔහු වෙනුවෙන් 2011 දෙසැම්බර් 21 දින සිට 2014 සැප්තැම්බර් 30 දින දක්වා එකතුව රු.173,995ක් වැඩිපුර වැටුප් හා ජීවන වියදම් දීමනාව ලෙස ගෙවා තිබූ අතර එය 2017 ඔක්තෝබර් 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(vi) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින්ගේ පදිංචි සහතික නිසි ක්‍රමවේදයකට අනුව ලබා නොගැනීම සහ මියයාම් නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් 2014 හා 2015 වර්ෂවල මියගිය විශ්‍රාමිකයින් 4 දෙනෙකු වෙත වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් ප්‍රමාණය රු.107,303 ක් විය.

(vii) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික හැඳුනුම්පත් අංකය නොමැතිව හා සාවද්‍ය ලෙස හැඳුනුම්පත් අංක සඳහන් කර දත්ත පද්ධතිය මගින් විශ්‍රාම වැටුප් ලබාගන්නා තිදෙනෙකු පිළිබඳ තොරතුරු පැවතුණි.

(viii) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් විසින් තම වසමේ පදිංචි විශ්‍රාමිකයන්ගේ මියයාම් පිළිබඳව නිසි පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වාර්තා නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පෙර මියගිය විශ්‍රාමිකයන් දෙදෙනෙකු සඳහා රු.49,861 ක් ඔවුන්ගේ බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කර තිබුණි. අදාළ මුදල් ATM යන්ත්‍ර ඔස්සේ ලබා ගෙන තිබූ බැවින් ආපසු අයකර ගැනීමට වගකිවයුතු පුද්ගලයෙකු සොයාගත නොහැකි වීම නිසා මු.රෙ.104 යටතේ කටයුතු කිරීමට යෝජනා කර තිබුණි.

(ix) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 සහ 2017 වර්ෂවල මියගිය විශ්‍රාමිකයන් 31 දෙනෙකු පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරීන් විසින් නිසි පරිදි වාර්තා නොකිරීම හේතුවෙන් ඔවුන්ගේ මරණයෙන් පසුවද රු.1,024,841 ක් ගිණුම් වෙත ප්‍රේෂණය කර තිබූ අතර එම මුදල් ගිණුම්වලින් ඉවත් කර ගැනීමද සිදුකර තිබුණි.

(ආ) **දිවිනැගුම වැඩසටහන**

-------------------------

(i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජූනි 08 දිනැති දිවිනැගුම චක්‍රලේඛ අංක 07/2015 ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා භාණ්ඩ බෙදා හැරීමේදී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිගත නොහැකි මට්ටමක පැවතුණි. ප්‍රතිලාභීන්ගේ කටයුතු පිළිබඳ පසු විපරම් නොකිරීම නිසා ලබා දෙන භාණ්ඩ හා උපකරණ වලින් ඵලදායි මෙහෙයක් ප්‍රතිලාභීන්ට හෝ රටට සිදුවීද යන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව කිසිදු ඇගයීම් වාර්තාවක් නොතිබුණි.

(ii) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී පුද්ගලයින් 06 දෙනෙකු වෙත රු.161,838ක් වටිනා ජුකී මැෂින් 06 ක් ලබාදීම හා ඒවා එම පුද්ගලයින් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ පරීක්ෂාවේදී එම උපකරණ වලින් නිසි ප්‍රතිඵල ලබා නොගන්නා බව නිරීක්ෂණය විය.

(iii) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015/ 2016 වර්ෂවලදී රු.4,848,705 ක් භාණ්ඩ මිලදී ගැනීම සඳහා වියදම් දරා තිබූ අතර ලබා දී තිබූ භාණ්ඩ වලින් ප්‍රමාණවත් ප්‍රතිඵලයක් ප්‍රතිලාභීන් විසින් අත්කර ගෙන නොතිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. විශාල මුදලක් රජය විසින් වෙන් කරන තත්ත්වයක් තුළ ඒවා අවශ්‍යතාවයන් පවතින නිසි පුද්ගලයා තෝරා ගෙන එම අයටම ලබාදීම කෙරේ වගකිවයුතු නිලධාරීන් වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් භාණ්ඩ බෙදා හැරීම වෙනුවට ග්‍රාමීය ආර්ථිකයට වඩාත් ගැලපෙන ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලිය හැකි වැඩ සටහන් පිළිබඳ සලකා බලා කටයුතු කිරීමත් වඩා යෝග්‍ය බව සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 අගෝස්තු 22 දිනැති දිවිනැගුම චක්‍රලේඛ අංක 07/2014 හි සඳහන් පරිදි ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මගින් ලබාදෙනු ලබන මූල්‍ය හා ණය පහසුකම්වලට අමතරව අපේක්ෂිත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ සහන අරණ ණය ක්‍රමය යටතේ දිවිනැගුම ප්‍රතිලාභීන් වෙනුවෙන් ලබාදී තිබූ ණය ක්‍රමය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ප්‍රතිලාභීන් 7,892 ක් වෙත රු.194,415,115 ක ණය නිකුත් කර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ප්‍රතිලාභීන් 3,782 කට අදාළව රු.51,835,091 ක හිඟ ණය ශේෂයක් පැවතුණි. මෙම ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි ඇප ලබාගෙන නොතිබීම නිසා නීතිමය කටයුතු කිරීම අපහසු තත්ත්වයක පැවතුණි.

(ඈ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවිනැගුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු මගින් විවිධ කාර්යයන් සඳහා ලබාදී ඇති ණය මුදල්වලින් 2017 මාර්තු 31 දිනට පුද්ගලයන් 74 දෙනෙකුට ලබාදුන් ණය මුදල් වලින් රු.1,454,342 ක් බොල් ණය ලෙස කපා හැර තිබුණි.

(ඉ) වත්තල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින් විවිධ කාර්යයන් සඳහා ලබාදී ඇති ණය මුදල් වලින් 2016 දෙසැම්බර් 31 දිනට රු.3,684,640 ක් කල් පසුවූ ණය ලෙස පවතින අතර රු.3,509,286 ක් බොල්ණය ලෙස කපා හැර තිබුණි.

(ඊ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ මැයි මාසයේ ඇතිවූ ගංවතුර හේතුවෙන් නිවාස හානි සඳහා පශ්චාත් ආපදා නිවාස හානි පූරණය කිරීමේ පිරිවැය ඇස්තමේන්තු මාර්ගෝපදේශය ප්‍රකාර සිදුවූ ගෘහ උපකරණ හානි සංඛ්‍යාව 394 ක් සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රු.4,253,475 ක් විය. අදාළ ඉල්ලුම්පත්වල මුල් පිටපත් ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමුකර තිබුණ නමුත් 2017 අප්‍රේල් වන විටත් සිදුවූ හානි වෙනුවෙන් ගෙවීම් කර නොතිබුණි

3.2 **පොදු තැන්පත් ගිණුම**

------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාළව වර්ෂ 2 ක් ඉක්මවූ අවස්ථා 335 කට අදාළව රු.12,788,451 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 23 දින දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතද, 2016 ජනවාරි 08 සැප්තැම්බර් 10 අතර දින 4 ක් තුළ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතද සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් එවන ලද රු.70,000 ක මුදලක් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ඇ) සමාජ ආරක්ෂණ සාමාජික අරමුදල් දින 15 කට වරක් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙත යැවියයුතු වුවද දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂය සඳහා ලැබීම් රු.8,860 ක්ද, 2016 නොවැම්බර් දක්වා වූ ලැබීම් රු.26,572 ක්ද ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයට අදාළව සාමාජිකයන් 42 ක ගෙන් ලද රු.84,211 ක් සහ 2016 වර්ෂයට අදාළව සාමාජිකයන් 09 ක ගෙන් ලද රු.10,298 ක් ද පොදු තැන්පත් ගිණුමට ගෙන තිබුණි.

(ඈ) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විවිධ ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අවස්ථා 04 කදී ලැබූ රු.1,098,774 ක මුදලක් එකී ව්‍යාපෘති ඉටුකිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන්ට ගෙවීමට බැංකු හා තැපැල් කාර්යාල වෙත යොමු කරන ලද මුදල් විවිධ හේතූන් පදනම් කරගෙන විශ්‍රාමිකයන් වෙත නොගෙවා ආපසු ගෙන්වා ගත් අවස්ථා 05 කට අදාළ රු.449,847 ක් පොදු තැන්පත් ගිණුමට ගෙන පසුව රජයේ ආදායමට ගෙන තිබුණි.

(ඊ) බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දහම් පාසල් ගුරුවරුන් සඳහා වූ පුස්තකාල දීමනා ලෙස ලද 2015 සහ 2016 වර්ෂවල පිළිවෙලින් රු.26,000 ක් සහ රු92,600 ක මුදල් අදාළ ගුරුභවතුන් වෙත නොගෙවා පොදු තැන්පත් ගිණුමට ගෙන තිබුණි.

3.3 **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට නිලධාරීන් 14 දෙනෙකුට අදාළව අයවීම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු.2,064,925 ක් විය. එම හිග හිටි ශේෂ නිලධාරීන් 9 කට අදාළව වර්ෂ 2 සිට 5 ත් අතරද නිලධාරීන් 5 කට අදාළව වර්ෂ 5 ට වැඩි කාලයක් ගෙන තිබුණත් එම හිග හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය සහ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර රු.119,659 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.4 **දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැරීම**

දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත වී තිබුණු රු.880,000 ක ව්‍යාපෘති 3ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ගිවිසුම් වලට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

3.5 **කාර්යසාධනය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කීපයක් පහත දැක්වේ.

(අ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 වර්ෂයේ ගම නැගුම ව්‍යාපෘතිය යටතේ ජාපාලවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා රු. ලක්ෂ 250 ක් අනුමතවී තිබුණු අතර එම වර්ෂයේදී රු.2,021,952 ක් වැය කර නළ ළිං දෙකක් ඉදිකර තිබුණි. 2017 පෙබරවාරි වන විටත් එම ව්‍යාපෘතිය අකර්මණ්‍යව පැවතුණු අතර ඉදිකරන ලද නළ ළිං දෙක භාවිතා කළ හැකි මට්ටමට සාදා නිමකර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක වර්ෂ 2001 - 2016 කාල පරිච්ඡේදය තුළ ඉදිකර තිබූ සේවා පියස් 23 ක් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක 1987 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉදිකර තිබූ සේවා

පියස් 64 ක් ප්‍රයෝජනයට ගන්නා නමුත් ඒවායේ ජලය විදුලිය ඇතුළු සනීපාරක්ෂක පහසුකම් සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) මීගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ ඉදිකිරීම් අරඹන ලද දුන්ගාල් පිටිය ප්‍රජා ශාලාව හා සේවා පියස රු.9,100,000 කට ඇස්තමේන්තු කර රු.8,201,264 ක් වැයකර ඉදිකර තිබුණු අතර මෙහි වැඩ කටයුතු 2015 මැයි 08 දින අවසන් කර තිබුණි. 2017 මාර්තු වන විට වැඩ නිමවී වර්ෂ 2 කට ආසන්න කාලයක් ගතවී ඇතත් මෙම ගොඩනැගිල්ල ජනතා අයිතියට පවරා දී නොතිබුණි.

(ඉ) මීගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තලාහේන මාතෘ නිවාසය හා සේවා පියස 2014 ඔක්තෝබර් 09 දින වැඩ ආරම්භ කර තිබූ අතර මෙම ගොඩනැගිල්ලෙහි කටයුතු 2017 මාර්තු වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. මේ හේතුවෙන් ඉතා අබලන් තත්ත්වයේ පවතින තලාහේන මාතෘ සායනය නව ගොඩනැගිල්ලට විතැන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) 2012, 2013 සහ 2014 වර්ෂවලදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා එවන ලද එකතුව රු.198,946 ක්වූ මුදල් අදාළ කාර්යයන් ඉටු නොකර 2016 වර්ෂයේදී රජයේ ආදායමට ගෙන තිබුණි.

## 3.6 පාඩු හා හානි

-----------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1999 සිට 2016 දක්වා කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළව එකතුව රු.591,430 ක් වූ වාහන අලාභ අයකර ගැනීමට නොහැකි වී ඇති අතර එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වාහන අනතුරක් සම්බන්ධයෙන් අලාභය ගණනය කර නොතිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකමක් නොලබන උප තැපැල් ස්ථානාධිපතිවරයෙකු වෙනුවෙන් වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රු.454,918 ක විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. මේ පිළිබඳ වරද අනාවරණය වීමෙන් පසුව වාරික වශයෙන් රු.46,000 ක් ආපසු අයකර තිබුණි. කෙසේ වුවද 2014 ජුලි 31 දින උක්ත නිලධාරියා මියගොස් ඇති අතර, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය හා නොසැලකිල්ල හේතුකොට ගෙන රජයට රු.408,918 ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගෙන් රජයට සිදුවූ අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.7 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරී වරියකගේ අධ්‍යාපන සහතිකවල දෝෂයන් පත්වීම් ලබා වසර 12 ක් ගතවූ පසුව අනාවරණය කරගෙන තිබුණි.

(ආ) 2014 ජුලි 23 දිනැති අංක 2/2014 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නිලධාරීන් 768 කට යතුරු පැදි ලබාදී තිබුණි. එයින් 347 දෙනෙකු රියදුරු බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ග්‍රාම නිලධාරි වසම් 120 ක පවුල් 5051 ක් අනවසර පදිංචි පවුල් ලෙස වාර්තා වී තිබුණි.

(ඈ) දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිව සිටින අය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර තොරතුරු හෙළිදරව් කරගෙන නොතිබුණි එසේ වුවද, 2016 පෙබරවාරි වන විට ග්‍රාම සේවා වසම් 07 කට අයත් ජනපද 05 ක පවත්වනු ලැබූ ඉඩම් කච්චේරි මගින් 1995 වර්ෂයට පෙර සිට පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් 93 දෙනෙකු හඳුනාගෙන තිබුණි.

ග්‍රාම සේවා වසම් 29 කට අදාළව ජනපද 33 ක් ඇති අතර මෙම ජනපදවල වපසරිය හා ඒවායේ පදිංචිකරුවන් සම්බන්ධ තොරතුරු රැස්කරගෙන නොතිබුණි.

(ඉ) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ ඉඩම්වල පදිංචි වී සිටින පදිංචිකරුවන් වෙත ලබා දීමට සකස් කරන ලද දීමනා බලපත්‍ර (ස්වර්ණ භූමි හා ජයභූමි ඔප්පු) ජනාධිපතිවරයා විසින් අත්සන් කළ පසු දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර අදාළ අයිතිකරුවන්ට භාරදිය යුතු වුවද එසේ භාර නොදුන් බලපත්‍ර 3 ක් 2017 ජුලි 12 දින වන විටත් රඳවාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- (i) ඉඩම් කොටස් 15 ක දීමනා පත්‍ර හිමියා හැර පිටස්තර පුද්ගලයන් අනවසරයෙන් පදිංචි වී තිබුණි.
- (ii) ඉඩම් කට්ටි 7 ක දීමනා පත්‍ර හිමියන් මියගොස් තිබුණි.
- (iii) ඉඩම් කට්ටි 15 ක දීමනා පත්‍ර හිමියාගේ මරණය සිදුවීම මත උරුමක්කරුවන් පදිංචි වී තිබුණි.
- (iv) ඉඩම් කට්ටි 5 ක අදාළ දීමනා පත්‍ර හිමියන් පදිංචි වී නොතිබුණි.
- (v) ඉඩම් කට්ටි එකක දීමනා පත්‍ර හිමියා වෙත මීට පෙරද දීමනා පත්‍රයක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.
- (vi) ඉඩම් කට්ටි 3 ක් සඳහා ඊට පෙර වෙනත් ඔප්පු නිකුත් කර ඇත.
- (vii) ඉඩම් කට්ටි 3 ක ඔප්පු කැබලි අංක හා රේඛා චිත්‍ර නිවැරදි කිරීම සඳහාත් කාර්යාලය වෙත ආපසු භාරගෙන තිබුණු අතර එක් ඉඩම් කට්ටියක් සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කර ඇති බවත් නිරීක්ෂණය විය.

(ඊ) කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම්වල දීමනා පත්‍රයක් රහිතව 2000 වර්ෂයට පෙර සිට පදිංචි පවුල් සංඛ්‍යාව 150 ක් වූ අතර 2000 වර්ෂයෙන් පසුව එම පදිංචි පවුල් සංඛ්‍යාව 108 ක් වී තිබුණි. මෙම පුද්ගලයන් හට ඔවුන්ගේ ඉඩම් හිමිකම් පිළිබඳ ගැටළුවලට විසඳුම් ලබා දීමට හෝ ඔවුන් එම ඉඩම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(උ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාජ සහතික 02 ක් නිකුත් කිරීම නිසා ග්‍රාම නිලධාරීවරයෙකු 2012 වර්ෂයේ මැයි 20 දින සිට වැඩ තහනම් කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම නිලධාරියාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

රු.107,170 ක ආපදා ණය ශේෂය වර්ෂ 5 ක සිට පැවත එමින් තිබුණත් එය අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඌ) **පාරිසරික ගැටළු**

**------------------**

(i) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මහජනයාට හිරිහැර වන අයුරින් සිදුවන ක්‍රියාකාරකම් 24 ක් සම්බන්ධයෙන් වූ පැමිණිලි සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් වී නොතිබුණි. තවද, අදාළ ආයතන හා පුද්ගලයන් වෙත යොමු කර ඇති සිද්ධීන් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක්ද සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පහත සඳහන් කර ඇති පාරිසරික ගැටළු පවතින බව නිරීක්ෂණය විය.

* විශාල ලෙස පස් ඉවත් කිරීම හා වැලි ගොඩ දැමීම
කෘෂිකාර්මික ඉඩම්වල පස් ඉවත් කිරීම හේතුවෙන් භූමි හායන තත්ත්වයක් ඇතිවිය හැකි බවත් මඩබාවිට, වේවැල්දෙණිය සහ පමුණුවත්ත යන වසම්වල විශාල වශයෙන් පස් ඉවත් කරන ලද ස්ථාන හඳුනාගත හැකිවීම.

* වන සම්පත සීඝ්‍රයෙන් අඩුවීම
මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙක්ටයාර් 1000 කට වැඩි ප්‍රමාණයක වනාන්තර ව්‍යාප්තව පවතින අතර මෙම වන සම්පත් සීඝ්‍රයෙන් විනාශ වීමේ ප්‍රවණතාවයක් දැකිය හැකිය. සැලසුමකින් තොරව සිදු කරනු ලබන ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා වනාන්තර හෙළි කිරීම, දැව ජාවාරම්කරුවන් විසින් රක්ෂිත කැලෑ කපා ඉවත් කිරීම වැනි හේතු මත සීඝ්‍රයෙන් වන සම්පත විනාශ කිරීම දැකිය හැකිය.

* 16 එෆ් හලුගල වසමේ ගල් වලවල් ආශ්‍රිත පරිසර ගැටළු විශාල ප්‍රමාණයක් පවතින අතර ප්‍රධාන මාර්ගයේ දිනකට ගල් පැටවූ ලොරි 200 ක් පමණ ධාවනය වේ. - අධික දූවිල්ල පැතිරයාම නිසා ස්වසන ආබාධ ඇතිවීම සහ නිවාස අපවිත්‍ර වීම

- ගල් කැඩීම නිසා විශාල ජල හිගයක් පැවතීම.
- කැලෑ සහිත ප්‍රදේශ එළි පෙහෙළි වීම.
- ගල් පතුරු නිවාස මත පතිත වීම නිසා නිවාස හානි වීම සහ ගැමියන්ට තුවාල වීම.
- යන්ත්‍ර මගින් ගල් කඩන නිසා විශාල ශබ්දයක් ඇතිවීම හේතුවෙන් ශබ්ද දූෂණය සිදුවීම.

පාංශු ඛාදනය ඇතිවීමෙන් ඉඩම් නිසරු වීම.
ගල් කැඩීම නිසා ඇතිවන දෙදරුමට ගොඩනැගිලිවලට හානි සිදුවීම.
කැඩුණු ගල් මත ජලය රඳා පැවතීම නිසා මදුරුවන් බෝවීම.
\- මෙම ගැටළු අදාළ බලධාරීන් වෙත වාර්තා කර ඒ සඳහා විසඳුම්

- ලබාදීම නිලධාරීන්ගේ යුතුකමක් හා වගකීමක් වුවත් ඒ පිළිබඳව
- මෙතෙක් අවධානය යොමුකර නොතිබුණි.

(iii) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත පරිදි පාරිසරික ගැටළු පැවතුණි.

(අ) අත්තනගල්ල ඔයට අප ජලය හා අපද්‍රව්‍ය බැහැර කිරීම

- රුවන්වැල්ල ප්‍රදේශයේ රබර් කිරි ආශ්‍රිත අපද්‍රව්‍ය අත්තනගලු ඔයට බැහැර කිරීම
- උණගහදෙණියේ ලලාන් ආයතනයේ අපද්‍රව්‍ය අත්තනගලු ඔයට බැහැර කිරීම.

(ආ) වතුපිටිවල කර්මාන්ත ශාලා මගින් පිටකරන අපද්‍රව්‍ය කුඹුරුවලට හා ඇල මාර්ග වලට මෙන්ම යටියන සුසාන භූමිය ප්‍රදේශයට බැහැර කිරීම.

(ඇ) වේයන්ගොඩ යුද හමුදා කඳවුරෙන් බැහැරලන අප ජලය හා අප ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම තුළින් කඳවුර අවට නිවෙස්වල ළිං ජලය අපවිත්‍ර වීම හා රෝග බෝවීමේ අවධානමට ලක්වී ඇත.

(ඈ) ඌරාපොළ ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන රථවාහන පිරිසිදු කිරීමේ ආයතනය මගින් අප ජලය හා අපද්‍රව්‍ය අවට කුඹුරුවලට හා ඇළ මාර්ගවලට බැහැර කිරීම හේතුවෙන් පාරිසරික ගැටළු මතුවීම.

(ඉ) 375 ඒ මීවිටිගම්මන මීගල්ල ප්‍රදේශයේ කළුගල් කැඩීම හේතුවෙන් ළිං හැරීමේදී ජලය නොමැතිකම නිසා පානීය ජල ගැටළුවලට නිවෙස් හිමියන්ට මුහුණ දීමට සිදුවීම.

(ඊ) 361 ගොඩගම පෙතියාකන්ද රක්ෂිතයට වතුපිටිවල ආයෝජන කලාපයෙන් සහ වෙනත් කර්මාන්ත ශාලා මගින් ගෙනෙන අපද්‍රව්‍ය බැහැර කර පිළිස්සීම හේතුවෙන් රක්ෂිතය විනාශ වීම. ජල මූලාශ්‍ර වලට අපද්‍රව්‍ය එකතුවීම මත ජල මූලාශ්‍ර විනාශ වීම. දුගඳ හේතුවෙන් ප්‍රදේශවාසීන් ශ්වසනාබාධවලට ලක්වීම.

(උ) වේබඩගල්ල ජය මාවතේ කාණු පද්ධතිය සකස් නොකිරීම හේතුවෙන් අප ජලය බැස නොයාම මත මාර්ගයට අප ජලය ගැලීම මගින් මාර්ගය අපිරිසිදු වීම සහ අවහිරවී. මාර්ගය සෝදා පාලුවට ලක්වීම.

(ඌ) සුරාසැල් වලින් ලබාගත් බීම වර්ගවල හිස් ටින් අතුරු මාවත්වලට දමා යෑම හේතුවෙන් ජලය එකතුවී මදුරුවන් බෝවීම.

(එ) තිහාරිය උතුර හා නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම්වල පවත්වාගෙන යනු ලබන ගව මස් වෙළෙඳසැල් හා ගව ඝාතකාගාර හේතුවෙන් ප්‍රදේශයේ දුර්ගන්ධය වර්ධනය වීම. ඇළ මාර්ගවලට අපද්‍රව්‍ය හා අප ජලය බැහැර කිරීම තුළින් ජලය හා පරිසර දූෂණය වීම.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 47 | 45 | 02 |
| (ii) | තෘතීයික මට්ටම | 28 | 22 | 06 |
| (iii) | ද්වීතියික මට්ටම | 3,051 | 2,677 | 374 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 121 | 105 | 16 |
| | එකතුව | 3,247 | 2,849 | 398 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක තනතුරු පුරප්පාඩු 398 ක් පැවතුණි.